# වසංගත රෝග නිවාරණය උදෙසා අනුගමනය කළ සාම්ප්‍රදායික ඥාණය ලංකා සමාජය ඇසුරින් සිදුකළ විමර්ශනාත්මක අධ්‍යනයක්

**කිරිඇල්ල කේ.ජී.සී.ඩී,[1] අයිරාංගනී එම්.කේ.එල්.[2]**

පුරාතන ලංකාවේ පැවති වසංගත රෝග පිළිබඳ අධ්‍යයනය කිරීමේදී දේශීය වශයෙන් හටගෙන ව්‍යාප්ත වූ වසංගත රෝග හා විදේශීය රටවලින් සංක්‍රමණය වූ වසංගත රෝග ලෙස කොටස් ද්විත්වයක් හඳුනාගත හැකිය. පුරාණ ගැමියන් මෙම රෝගයන්හි පැතිරීමේ වේගය, භයංකර ප්‍රතිවිපාක, රෝග සුව වීමට යම් කාලයක් ගතවීම ආදී ස්වභාවයන් නිසා ''දෙවියන්ගේ ලෙඩ'' ලෙස හඳුන්වාදී ඇත. මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වන්නේ වසංගත රෝගවලට මුහුණදුන් ජනතාව තම ජන ජීවිතය යතාවත් කර ගැනීම උදෙසා භාවිතකළ සාම්ප්‍රදායික රෝග නිවාරණ ක්‍රම පිළිබඳව අධ්‍යයනයට ලක් කිරීමයි. පර්යේෂණ ගැටළුව වන්නේ අතීත ජනයා වසංගත රෝග නිවාරණය උදෙසා අස්පර්ශණීය උරුමයක් ලෙස යොදාගනු ලැබූ සාම්ප්‍රදායික ඥාණයේ භාවිතය කෙබඳුදැයි අධ්‍යනය කිරීමයි. මෙහිදී පුස්තකාල අධ්‍යයනය සහ සම්මුඛ සාකච්ඡා මගින් දත්ත එක්රැස් කරගන්නා ලද අතර ඒවා ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍ර සමග සන්සන්දනය කරමින් ඓතිහාසික සන්සන්දනාත්මක ක්‍රමවේදය යටතේ විශ්ලේෂණය කරන ලදී. අතීත ගැමියන් වසංගත රෝග නිවාරණය උදෙසා සාම්ප්‍රදායික කාය චිකිත්සක ක්‍රම මෙන්ම සාම්ප්‍රදායික මනෝචිකිත්සක ක්‍රමවේදයන් ද්විත්වය යොදාගෙන ඇත. රෝගයට ගොදුරු වූ පුද්ගලයා වාතාශ්‍රය සහිත කාමරයක තනිකොට කාමරයට හා නිවසට නිතර කහ වතුර ඉසීම, දෙහි කැබලි කපා දැමූ දිය බඳුනක් රෝගියාගේ ඇඳ අසල තැබීම, රෝගියාගේ නිවස ඉදිරිපිට ගොක්කොළ හෝ කොහොඹ කොළ එල්ලීම, නිවසේ සාමාජිකයන්ට පෙරුම්කායම් බැඳීම, වදකහ කැබලි බැඳීම, දුම් ඇල්ලීම හා ස්නානය කිරීම, ඖෂධ ආලේපනය හා පානයන් ලබාදීම යනාදිය සිදුකර ඇත. පැපොල වැනි රෝග වැළදුනු අවස්ථාවන්වලදී රෝගියාව ඇඳෙහි සුදු පැහැති ඇතිරිල්ලක් යොදා ඒ මත කෙසෙල් කොළයක් දමා එහි කොහොඹ පත්‍ර අතුරා රෝගියාට එහි නිදා ගැනීමට සලස්වා ඇත. තවද කම්මුල් ගාය වැළදුණු විට අලිහක්ක ගලගා දෙහි සමග මිශ්‍ර කොට කම්මුලෙහි ආලේප කර ඇති බව අධ්‍යයනයේදී අනාවරණය වී ඇත. මීට අමතරව රෝගියාට ලබාදී ඇති ආහාර-පාන පවා රෝග නිවාරණය උදෙසා බෙහෙවින් ඉවහල්වී ඇත. වසංගත රෝගයක් වැළඳුණු විට පත්තිනි මෑණියන්ට භාර වීම සිදුවිය. රෝගය සුව වූ පසු කිරි අම්මාවරුන්ට දානය ලබාදීම සිදුකොට ඇත. මීට අමතරව රතන සූත්‍රය සජ්ජායනය කිරීම, බෝධි පූජා පැවැත්වීම යනාදී මානසික නිරෝගීකම ඇති කිරීමේ සාම්ප්‍රදායික ක්‍රම භාවිතාකොට ඇත. මේ අනුව අධ්‍යයනයේදී අපට නිගමනය කළහැකි වන්නේ අතීත ජනයා අස්පර්ශනීය උරුමයක් ලෙස සාම්ප්‍රදායික ඥාණය භාවිත කරමින් රෝග නිවාරණය හා රෝග ව්‍යාප්තිය සීමා කරගෙන ඇති බවත්, ජීවත්වන පරිසරයට අනුගතව, පරිසරයේ සම්පත් උපයෝජනය කරගනිමින් පවත්නා රාජ්‍ය අධිකාරයට භාරයක් නොවී සාම්ප්‍රදායික ඥාණය හා සාමූහිකත්වය හරහා වසංගත රෝග අභියෝගයන්ට සාර්ථකව මුහුණදී ඇති බවත් වර්තමාන සමාජයට මෙම දැනුම නැවත සම්ප්‍රේෂණය කිරීමේ අවශ්‍යතාවය අප හමුවේ ඇති බවයි.

**ප්‍රමුඛ පද :** වසංගත රෝග,නිවාරණය, සාම්ප්‍රදායික ඥාණය, චිකිත්සක ක්‍රම, මනෝචිකිත්සක ක්‍රම

---

[1,2] මානවශාස්ත්‍රපීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.kgchathuri22@gmail.com